**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය - 2019**

**-----------------------------------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**-----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන විසින් දරන ලද පුනරාවර්තන වියදම් රු. 2,924,950 ක් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණ ද, අදාල ප්‍රදාන ලැබීම් කාර්යාලයේ ආදායමක් ලෙස හදුනා නොගෙන සංචිතවලට එකතු කර තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ කාර්යාලයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | මෙම වරද 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට අදාල නිළධාරීන්ට උපදෙස් දෙන ලදි. | ප්‍රදාන ලැබීම් නිවැරිදිව ගිණුම්ගත කළ යුතු බව. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ වියදම් අයිතම 3කට අදාළව ගෙවිය යුතු වටිනාකම රු. 1,436,320 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2020 වර්ෂයේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු බව. |

| | | |
|---|---|---|
| (ඇ)අතුරුදහන් වු තැනැත්තන් පිළිබඳ ජාත්‍යන්තර දිනය වෙනුවෙන් දරන ලද රු.2,505,909 ක උත්සව වියදම් ප්‍රාග්ධනිත කර තිබුණි. | ජාත්‍යන්තර දිනය සඳහා වැය කිරීමට බලාපොරොත්තු වන සියලුම වියදම් අප විසින් ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ ඉල්ලුම් කර ඇත.ඒ අනුව මහා භාණ්ඩාගාරය විසින් ප්‍රාග්ධන ප්‍රතිපාදන වශයෙන් අදාල මුදල් ලබා දී ඇති අතර ඒ අනුව ඒ සඳහා වැයකරන ලද මුළු මුදල ප්‍රාග්ධනිත කර ඇත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු බව. |
| (ඈ)ඉදිරි වර්ෂය වෙනුවෙන් ගෙවන ලද රු.200,000 ක ගොඩනැගිලි කුලී වියදම සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | අදාල වරද 2020 වර්ෂයේ දී නිවැරදි කිරීමට අදාල නිළධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු බව. |
| (ඉ) සමාලෝචිත වර්ෂයේදි ගෙවන ලද රු.2,450,000 ක ගොඩනැගිලි කුලී වියදම වෙනත් සේවා වියදම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අදාල වරද 2020 වර්ෂයේ දී නිවැරදි කිරීමට අදාල නිළධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු බව. |
| (ඊ)සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් වටිනාකම රු. 6,845,457 ක්වු පරිගණක හා උපාංග මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වශයෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ සිට අප ආයතනයට වෙන් වූ සුදුසු ගිණුම් සංකේත හදුන්වා දී ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලෙස උපදෙස් දෙන ලදි. | වත්කම් නිවැරදිව වර්ගීකරණය කළ යුතු බව. |

**1.5.2 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබී තිබුණ රු. 2,935,713 ක් අයහාර වියදම් සඳහා වැය කර එම ප්‍රදාන ලැබීම් කාර්යාලයේ ආදායමක් ලෙස දක්වා තිබුණ ද, මේ සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | අප ආයතනය විසින් 2019 වර්ෂයේ මහා භාණ්ඩාගාරයෙන් පුනරාවර්ථන වියදම් වලට ලැබුණු ප්‍රතිපාදන වලට අමතරව දැරීමට සිදු වූ රු.2,935,713ක මුදල, මුදල් අමාත්‍යාංශයේ දැනුවත් කිරීම මත අප වෙත ප්‍රාග්ධන ප්‍රතිපාදන වශයෙන් ලැබුණ මුදල් උපයෝගී කරගෙන වැය කරන ලදි. ඒ අනුව මෙම මුදල පුනරාවර්ථන වියදම් සඳහා ලැබුන අරමුදල් ලෙස සලකා 2019 මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර ඇත. | භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගත යුතු බව. |

**1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2017 නොවැම්බර් 21 දිනැති අංක 02/2017 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2 (i) ඡේදය | අමාත්‍යාංශය සතු වාහනයක් චක්‍රලේඛය ප්‍රකාරව විධිමත් පවරා ගැනීමකින් තොරව භාවිතයට ගෙන තිබූ අතර වාහන නඩත්තු වියදම් හා ඉන්ධන වෙනුවෙන් පිළිවෙලින් රු.252,087ක් හා රු.328,802 ක් දරා තිබුණි. | අමාත්‍යාංශය මඟින් තාවකාලික පදනම මත එක් වාහනයක් අප වෙත ලබා දෙන ලදි. එම වාහනයේ නඩත්තුව හා ඉන්ධන වශයෙන් මෙම වියදම් දරා ඇත. 2020 වර්ෂයේ එම වාහනය අප වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 7,445,221ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,076,345 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,368,876 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පුද්ගල වියදම්, ගමන් වියදම්, සැපයීම් හා පාරිභෝගික වියදම් හා සේවා වියදම් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 39 න් 30 ක් හා තෘතිය මට්ටමේ තනතුරු 114 න් 99 ක්ම පුරප්පාඩු පැවතීම පරිපාලන කටයුතු කෙරෙහි අහිතකර බලපෑම් ඇති වීමේ හැකියාවක් පැවතිය හැකි බව විගණනයේදි නිරීක්ෂණය විය. | බඳවා ගැනීමේ ක්‍රියාදාමයට කල්ගත වන අතර ඇතැම් තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටිය සහ නිර්දේශිත වැටුප අනුව සුදුසු පුද්ගලයින් බඳවාගැනීමට නොහැකි වූ අතර එසේම මෙම අවධියේ රටේ පැවැත් වූ මැතිවරණය හේතුවෙන් නව බඳවා ගැනීම් අත්හිටුවීමට සිදුවීමෙන් ද පැවති පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අපොහොසත් විය. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙනුවෙන් 2019 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර තිබුණද, ආයතනයේ අවශ්‍යතාවයන් වෙනුවෙන් උපකරණ හා භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් පමණක් මෙම ක්‍රියාකාරි සැලැස්ම සකස් කර තිබුණු අතර 2016 අංක 14 දරණ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරිම හා කර්තව්‍ය ඉටු කිරීම) පනතේ II කොටසේ 10 (1)හි දැක්වෙන කාර්යභාරයන් ඉටු කිරීමට අදාළ කාර්යයන් කිසිවක් මෙම ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | 2019 ක්‍රියාකාරී සැලැස්මේ මූල්‍යමය වශයෙන් සිදුකරන කාර්යයන් ඇතුලත් කර තිබූ අතර මූල්‍යමය වියදම් දැරීමක් සිදුනොවන නමුත් අප විසින් 2019 වර්ෂයේ දී සිදු කිරීමට සැළසුම් කළ කාර්යයන් 2018 වාර්ෂික වාර්තාවේ ඇතුලත් කර ඇත. | ඉටුකිරිමට අපේක්ෂිත සියළුම කාර්යයන් ඇතුළත් කර ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කල යුතු බව. |